L

Article 12(1)

**ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව**

**இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு**

**HUMAN RIGHTS COMMISSION OF SRI LANKA**

| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல. / My No. | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date: 2019-08-04 |

| | | |
|---|---|---|
| පැමිණිලිකාර පාර්ශවය | : | සේගු ආදම් ඉම්රු රසාක් මහතා,<br>අංක. 79/2, සෙයියන්නෙවෙල,<br>මහනුවර. |
| වගඋත්තරකාර පාර්ශවය | : | විදුහල්පති,<br>මහ/ කිංස්වුඩ් විද්‍යාලය,<br>මහනුවර. |
| <u>පැමිණිලි අංකය</u> | <u>:</u> | <u>**HRC/K/483/16**</u> |

**පැමිණිල්ලේ සැලකිරීම :-**

ඉහත නම සඳහන් පැමිණිලිකරු විසින් මානව හිමිකම කොමිෂන් සභාව වෙත පැමිණිල්ලක් ඉදිරිපත් කරමින් සඳහන් කර ඇත්තේ, තමා උපන් දා සිට මෙ දක්වා මහනුවර, දෙයියන්නේවෙල අංක 79/2 දරණ ලිපිනයේ ස්ථිරව පදිංචි වී සිටි බවත්, ඒ අනුව තම දරුවා 2017 වර්ෂයේ පළමු ශ්‍රේණියට ඇතුලත් කර ගැනීම පිණිස පාසලට ආසන්න පදිංචිකරුවන්ගේ පදනම යටතේ මහනුවර කිංස්වුඩ් විද්‍යාලය වෙත අයදුම්පතක් යොමු කරන ලද නමුත් පදිංච ස්ථානයේ හිමිකම ඔප්පුවේ අයිතිය සම්බන්ධව සුදුසුකම සපුරා නොමැති බව දන්වමින් සම්මුඛ පරීක්ෂණයට කැඳවීම ප්‍රතික්ෂේප වූ බව තමා වෙත දන්වා ඇති බවත්ය.

නමුත් තමා අදාළ ස්ථානයේ පදිංචිව සිටින බවට හා ඒ අනුව තම දරුවා පාසලට ඇතුළත් වීමට සියලූ සුදුසුකම සපුරා ඇති බවට පහත ලේඛන මඟින් තහවුරු වන බවද සඳහන් කර ඇත.

01. උපන් දා සිට ඉහත ලිපිනයේ ස්ථිර පදිංච බවට තමාගේ උප්පැන්න සහතිකය, ජාතික හැඳුනුම්පත, විවාහ සහතිකය යනාදියෙන් පැහැදිලිව ඔප්පුවීමත්.

02. ඡන්ද හිමි ඡන්ද දායකයෙකු බව ඡන්ද හිමි නාම ලේඛනයෙන් තහවුරු වීමත්,




| | | | | | |
|---|---|---|---|---|---|
| ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office | 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04. / 14, R. A. De Mel Mawatha, Colombo - 04. | සභාපති / தவிசாளர் / Chairperson | 011-2505451 | ෆැක්ස් / தொலைநகல் / Fax | 011-2505541 / 74 | ඊමේල් / மின்னஞ்சல் / E-mail | sechrc@gmail.com |
| දුරකථන / தொலைபேசி / Telephone | 94-11-2505580 / 81 / 82 | ලේකම් / செயலாளர் / Secretary | 011-2505521 | ක්ෂණික / துரித அழைப்பு / Hotline | 1996 | වෙබ් / இணையம் / Web | www.hrcsl.lk |

03. තමා විසින් අංක 79/2 දරණ ඉහත ලිපිනයට අයත් එම ගොඩනැගිල්ලේම බිම් මහලේ වෙළඳ ව්‍යාපාරයක් පවත්වා ගෙන යන බවට ලියකියවිලි (ආදායම් බදු, වාහන ලියාපදිංචිය) ජාතිය ගොඩනැගීමේ බදු ගෙවීමත් මගින් තහවුරු වීමත්,

04. තමාගේ විවාහ සහතිකය සහ භාර්යාවගේ උප්පැන්න සහතිකයෙන් ඇයද උපන්දා සිට තමාගේ ලිපිනයේ ආසන්නයේ 87/5 දරණ නිවසේ පදිංචි බව තහවුරු වීමත්.

05. එසේම පදිංචි නිවසේ ඔප්පුව හිමි අවිවාහක පනස්තුන් වියැති තමාගේ සොයුරිය ජීවත් වන්නේද තමා සමඟම වන අතරම ඇයගේ වියපැහැදම් දරන්නේ තමා විසින් බැවින් ඇයගේ කැමැත්තෙන් ඇය විසින්ම ඉදිරියේදී තමා වෙත එම ඔප්පුව පැවරීම සඳහා කටයුතු කරන බව දිවුරුම් ප්‍රකාශයකින් ඉදිරිපත් කර තිබීමත්, යන ලේඛන මගින් තමා එම ස්ථානයේ පදිංචිව සිටින බවට තහවුරු වන බවට සඳහන් කර ඇත.

ඒ අනුව ඉහත සඳහන් ලිපිනයේ උපන් දා සිට පදිංචි බව තහවුරු කෙරෙන ඉහත ලිපි ලේඛන සියල්ලද ඉදිරිපත් කළ නමුත් තම දරුවා පාසලට ඇතුලත් කරන සම්මුඛ පරීක්ෂණයෙන් ප්‍රති ෂේප වීම තුළින් තමා හට විශාල අසාධාරණයක් සිදුවී ඇති බවට මෙම පැමිණිල්ල මගින් ඉල්ලා සිට ඇත.

වගඋත්තරකාර පාර්ශවීය සැලකිරීම :-

පැමිණිල්ලට අදාළව වගඋත්තරකාර පාර්ශවීය මහනුවර කිංස්වුඩ් විද්‍යාලයේ විදුහල්පති විසින් කොමිෂන් සභාව වෙත කරුණු දක්වමින් සඳහන් කර ඇත්තේ, පැමිණිලිකරු විසින් සිය දරුවා 2017 වර්ෂයේ පළමු වසරට ඇතුලත් කරගැනීමට අදාළව ආසන්න පදිංචිකරුවන්ගේ ගණය යටතේ අයදුම් කර ඇති බවත්, ඊට අදාළ මූලික පරීක්ෂණයේදී පැමිණිලිකරුගේ ස්ථිර පදිංචිය සනාථ කිරීමට ඉදිරිපත් කර තිබූ ලියවිලි පරීක්ෂා කරන ලද බවත්, ඒ අනුව අදාළ ස්ථානයේ ඉඩම් හිමිකරු වන්නේ සේගු ආදාම් සිත්ති නිහාරා නැමැත්තියක් බවත්, ඇය පැමිණිලිකරුගේ සොයුරිය බවත්, චක්‍රලේඛනයට අනුව පදිංචි ස්ථානය හිමිකරු සතු නොවේ නම් ලකුණු ප්‍රදානය කළ නොහැකි බැවින් හා පැමිණිලිකරු ඔප්පුව තම සොයුරියගේ බව පිළිගෙන ඇති බැවින් පැමිණිලිකරුගේ අයදුම්පත මූලික පරීක්ෂණයේදීම ප්‍රතික්ෂේප වූ බවත් ය.

විමර්ශණ හා පරීක්ෂණ කටයුතු වලදී අනාවරණය වී ඇති කරුණු :-

පැමිණිලිකරු සිය දරුවා 2017 වර්ෂයේ මහනුවර කිංස්වුඩ් විද්‍යාලයේ 1 වන වසරට ඇතුළත් කර ගැනීම සඳහා පාසලට ආසන්න පදිංචිකරුවන්ගේ ගණය යටතේ අයදුම්කර ඇති අතර සම්මුඛ පරීක්ෂණ

මණ්ඩලය විසින් පැමිණිලිකරුගේ පදිංචි ස්ථානයේ හිමිකම තහවුරු නොවන බව දන්වා සම්මුඛ පරීක්ෂණයට නොකැඳවා අයදුම්පත ප්‍රතික්ෂේප කර ඇත. 2017 වර්ෂයේ පාසැල් වල පළමු ශ්‍රේණියට ළමයින් ඇතුලත් කර ගැනීමේ අංක 17/02016 දරණ චක්‍රලේඛයෙහි අයදුම්කරුගේ පදිංචි ස්ථානයේ හිමිකම තහවුරු නොවේ නම් අයදුම්පත ප්‍රතික්ෂේප කිරීමට කිසිදු ප්‍රතිපාදනයක් සලසා නොමැති අතර, සම්මුඛ පරීක්ෂණයට අයදුම්කරුවන් කැඳවූයේ නම් පදිංචි ස්ථානයේ හිමිකම තහවුරු නොකිරීම මත අදාළ ලකුණු ප්‍රමාණය අහිමි වුවද ඉතිරි ලකුණු ප්‍රමාණය පැමිණිලිකරුට ලබාගත හැකිව තිබුණි. නමුත් එම අවස්ථාව පැමිණිලිකරු වෙත අහිමි කර ඇති බව නිරීක්ෂණය වේ. ඒ අනුව වගඋත්තර පාර්ශවීය මහනුවර කිංස්වුඩ් විද්‍යාලයේ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් පැමිණිලි පාර්ශවයට අගතියක් කර ඇති බව පැහැදිලිව පෙනී යයි.

මෙහිදී <u>ශයනි ගීතිකා එරෙහිව දිසානායක SCFR 35/2011</u> නඩු තීන්දුවෙහි ප්‍රකාශ වූයේ පදිංචිය සනාථ කිරීම අව්‍යාජව ගොඩනැගීම සඳහා සමුච්චි ය ප්‍රතිඵලයක් ලබාගැනීමට පළමු ශ්‍රේණිය සඳහා වූ අයදුම්පත්‍රය සමඟ ඉදිරිපත් කර ඇති ලේඛන සියල්ල සුපරීක්ෂාකාරීව අධ්‍යයනය කළ යුතු බවයි. එසේම <u>පුෂ්පරාජන් රොහාන් එරෙහිව කාරියවසම් SCFR 06/2017</u> නඩුවෙහි ප්‍රකාශ වූයේ පදිංචිය සනාථ කිරීම සඳහා අවශ්‍ය ලේඛන අතරින් එක් ලේඛනයක් ඉදිරිපත් කිරීමට අපොහොසත් වූ පමණින් ඒ මත ඉතිරි නිර්ණායක සඳහා ලකුණු ලබා නොදීමට පාසල ගත් තීරණය අත්තනෝමතික තීරණයක් බවයි.

නිගමනය :-

වගඋත්තර පාර්ශවීය මහනුවර කිංස්වුඩ් විද්‍යාලයේ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පැමිණිලිකරුගේ පදිංචි ස්ථානයේ හිමිකම තහවුරු නොවන බව සලකා සම්මුඛ පරීක්ෂණට නොකැඳවීම හේතුවෙන් පැමිණිලිකරුගේ දරුවා පාසලට ඇතුලත් කර ගැනීමට තිබූ අවස්ථාව අහිමි වීමෙන් පැමිණිලිකරුට 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාව මඟින් සහතික කර දී ඇති සර්ව සාධාරණයේ මූලික අයිතිය උල්ලංඝනය කර ඇති බව මෙයින් නිගමනය කරනු ලැබේ.

නිර්දේශ :-

අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් විශේෂිත සම්මුඛ පරීක්ෂණයකට පැමිණිලිකරු කැඳවා ලබා ගන්නා ලකුණු අනුව මහ/ කිංස්වුඩ් විද්‍යාලයේ 2017 වර්ෂයේ පළමු ශ්‍රේණියට ඇතුලත් වීමට සුදුසුකම් ලබන්නේ නම් දරුවා පාසලට ඇතුළත් කරගත යුතු බවට (2018 වර්ෂයේ දෙවන ශ්‍රේණියට) මෙයින් නිර්දේශ කරනු ලැබේ.

2019.07.08 දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේ ම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම් දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොලබන බවද වැඩිදුරටත් දන්වමු.

කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

**Commissioner**
Human Rights Commission of Sri Lanka
No. 14, R.A. De Mel Mawatha,
Colombo 04.

කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

**Commissioner**
Human Rights Commission of Sri Lanka
No. 14, R.A. De Mel Mawatha,
Colombo 04.

පිටපත :- 01. අමාත්‍ය අකිල විරාජ් කාරියවසම් මයා,
අධ්‍යාපන අමාත්‍යාංශය,
ඉසුරුපාය, බත්තරමුල්ල.

02. ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය
ඉසුරුපාය බත්තරමුල්ල.

B/